# වියතුන් සබා මැද?







අපට රණස්ගල්ලේ හාමුදුරුවන් මතක් වන්නේ එක්කෝ කාට හරි උපදෙසක් දෙන්නට ගිය වෙලාවට ය. නැත්නම් හොඳ පහරක් එල්ල කරන්නට වුවමනා වූ විට ය.

මේ නම් ඒ දෙකටම වෙනස් අරමුණක් ඇතිව එක දෙයක් විතරක් උපුටා ගැනීමකි. එය හුදෙක් වත්මන් ශ්‍රී ලංකාවේ දිගට ඇදී යමින් ඇති සරසවි ඇදුරන්ගේ වැටුප් ප්‍රශ්නය ගැන ප්‍රවේශයක් වශයෙනි.

දැන් බැලූ කොට කොයි කොයි පැත්ත හරි ද කොයි පැත්ත වැරදිද කියා සිතාගන්නත් අමාරුයි. එක පැත්තකින් තමාට හිමි හා නිසි වැටුප නොපමාව දෙන්නැයි උද්ඝෝෂණය කරන සරසවි ඇදුරෝ ය. අනෙක් පැත්තේ කෙළින්ම නොකීවත් මේ සියල්ල ජවිපයෙන් රජයට එරෙහි ව කරගෙන යන ව්‍යාපාරයේ එකම පියවරක් ලෙසින් හඳුන්වන්නට තැත් කරන රජය හා රාජ්‍ය පාක්ෂික පිරිස් ය.

ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න ඇතුළු වයිවාරන්න වියතුන් ලියූ ලිපි දිගින් දිගටම ශ්‍රී ලංකාවේ පත්තර වල පළ වූයේ ය. සරසවි සමග නොබැඳුණු අය පවා ඉඳ හිට අදහස් ප්‍රකාශ කරන්නේ ය.

සරසවි පිවිසුමෙන් දිනූ දරු දැරියනට නායකත්ව පුහුණුව දීමේ වැඩ සටහන සාර්ථක අයුරින් ආරම්භ කළ උසස් අධ්‍යාපන ඇමතිවරයා ඔවුන්ගෙන් ඉහළ මට්ටමක සිටින පිරිස ගැන ඒ තරම්ම අවධානයක් යොමු නොකරන්නේ ඇයිද යන්න ප්‍රශ්නයකි. ප්‍රශ්නයට කෙළින්ම බහින්නට කලින් අපි වටා පිටාව ගැන කතා කරමු.

ජනාධිපතිතුමා ඇතුළු නායකයෝ බොහෝ දෙනා අද ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීම ගැන ආඩම්බරයෙන් කතා කරති. එය හොඳ චේතනාවකි. හොඳ අරමුණකි. ප්‍රශ්නය ඒ ආශ්චර්යය උදා කිරීමට පෙරමුණ ගන්නේ කවුද යන්න ය.

දේශපාලකයෝ ද? සරසවි ඇදුරන් නැත්නම් බුද්ධිමත්තු ද? බුද්ධිය පමණක් මදි ය. බුද්ධිමතුන් යම් යම් අංශයන්හි විශේෂඥයන් බවට පත් විය යුතු ය. පත් කළ යුතු ය. ඒ කාරිය අර වාගේ නායකත්ව පුහුණුවකින් ඉටු කළ හැක්කක් නොවේ. විධිමත් අධ්‍යාපනයක් පුහුණුවක් දීමෙන් පමණක් ඉටු කළ හැකි කාර්යයකි.

එබන්දක් දෙන්නේ කොයිබක ද? කවු ද? ඒ ප්‍රශ්න දෙකට පිළිතුරු දෙන විට අපට සරසවිය දෙසට සරසවි ඇදුරා දෙසට නෙත් යොමු කරන්නට සිදුවෙයි.

සරසවි ඇදුරන් බවට පත් වන්නේ රටක බුද්ධිමත් පිරිසගෙන් අතළොස්සක් පමණි. ඒ සිය හැකියා

***<u>මේ සමහර චෝදනා සැබෑ වන්නට ද ඉඩ ඇත . ඒ සැබෑ නම් කළ යුත්තේ මකුණන් මැරීමේ ක්‍රමය උපයෝගී කර නොගෙන එබඳු තැන් නිදොස් කිරීමට නොපමාව ක්‍රියා කිරීම ය. එසේ නැතිව සමස්ත විශ්ව විද්‍යාල උපදේශක පරම්පරාවම හෙළා දැකීම හෝ හෑල්ලු කිරීම නොවේ.</u>***

සහ දැනුම වර්ධනය කර ගැනීමට අවසර ලත් තෝරා ගන්නා ලද සුළු පිරිසක් ය. විශේෂ අධ්‍යාපනයක් හෝ පහුණුවක් සඳහා තෝරා ගෙන ඔවුන් වර්ධනය කිරීමෙන් රටක් බලාපොරොත්තු වන්නේ කුමක් ද? හුදෙක් පඬි කන තවත් උගතුන් පිරිසක් බිහි කිරීමට පමණක්ද? නැතහොත් ඔවුන්ගේ දැනුම හා හැකියාව උපයෝගී කරගෙන අනාගතයට පිරිමහින උගත් බුද්ධිමත් පරපුරක් සකස් කර ගැනීම ද? ඒ විදියේ ජාතික මෙහෙවරක නිරත වන පිරිස පාලකයන්ගේ පමණක් නොව සමස්ත ජාතියේ ම ගෞරවයට පාත්‍ර විය යුතුය.

එසේ වුවත් අද දවසේ සරසවි උගතුන්ට ලැබෙන ලංසුව ගැන අගනා ලිපියක් කොළඹ සරසවියේ මහාචාර්යවරියක වන හපුආරච්චි නම් ලේඛිකාවක් පුවත්පත් ලිපියකින් අවධාරණය කළා ය. ඇය කියා ඇති ආකාරයට ජාත්‍යන්තර කීර්තියක් හෝ පිළිගැනීමක් ලැබෙන්නේ ශ්‍රී ලංකාවේ දේශපාලකයන්ට හා ක්‍රීඩකයන්ට පමණකි. ජාත්‍යන්තර වශයෙන් පවා පිළිගැනීමක් ලැබෙන සුවිශේෂ කාර්යයන්ට අත ගසන සරසවි ඇදුරෝ නිහඬව ඒ සේවය ඉටු කොට පසෙකට වී බලා සිටින්නෝ ය. තවත් මහාචාර්යවරයකු ලියූ ලිපියකින් පෙන්වා දෙනු ලැබුණේ වත්මන් රජය ඉදිරියේ ඇති ගැටලු ගණනාවක් නිරාකරණය කරනුවස් ඔහු විසින්ම ඉටු කරන ලද සේවාවන් ය. ඒ කියන කිසිදු මෙහෙවරක් සෙසු පටු අයට කළ නොහැකි ය. වෙනසකට ඇත්තේ ඒ කියන මහාචාර්යවරයා තමා කළ සේවය ගැන ප්‍රචාරය කරමින් රජයේ හෝ මැති ඇමතිවරුන්ගේ අනුග්‍රහය ලබන්නට නොයාම ය. ඔහු තමා නිරතවන රාජකාරිය ගැන පමණක් යොමුව සිටියි.

සරසවි ඇදුරන් සමහරකු පරණ දේශන සටහන් පුන පුනා වසරක් පාසා සිසුන් ඉදිරියේ කියවන බවට කට කතාවක් ඇත. මා සරසවියේ සිටිය දී අපට ඉන්දියා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය ඉගැන් වූ සිංහ නම් ඉන්දියානු කථිකාචාර්යවරයා ගැන ද ඔය වාගේම කතාවක් සරසවි සිසුන් අතර ප්‍රචලිතව තිබුණේ ය. ඒ ඔහුගේ දේශන සටහන් වල තැනින් තැන -මෙතනට විහිලුවක්" යන්න සටහන් කරගෙන තිබුණු බව ය. ඒත් පරණ දේශන සටහන් ය. ඊට වඩා දරුණු කතාව වන්නේ සිය දේශන සටහන් මුද්‍රණය කර විකුණාගන්නා ඇදුරන් පිළිබඳ පුවත ය. කේ ජයතිලක කලකට උඩ දී ඒ ඩී රන්ජිත් කුමාර නමැති ලේඛකයා සමග පැවැත්වූ පිළිසඳරක දී ඉගැන්වීම ගැන සිතනවාට වඩා ව්‍යාපාරික කටයුතු කෙරෙහි යොමු වූ සරසවි ඇදුරන් ගැන කියා තිබුණි. මෑතක බොහෝ තැනක කියැවෙන කරුණක් වනුයේ සරසවි ඇදුරන් වෘත්තීය අවශ්‍යතාවක් වශයෙන් කළ යුතුම වූ පර්යේෂණ පවා අතපසු කරන බව ය.

මේ සමහර චෝදනා සැබෑ වන්නට ද ඉඩ ඇත . ඒ සැබෑ නම් කළ යුත්තේ මකුණන් මැරීමේ ක්‍රමය උපයෝගී කර නොගෙන එබඳු තැන් නිදොස් කිරීමට නොපමාව ක්‍රියා කිරීම ය. එසේ නැතිව සමස්ත විශ්ව විද්‍යාල උපදේශක පරම්පරාවම හෙළා දැකීම හෝ හෑල්ලු කිරීම නොවේ.

දියුණු වූ තාක්ෂණයක් සහිත අද වැනි යුගයක සරසවි ඇදුරන් ගේ දැනුම ද යාවත්කාලීන වන පරිදි නවීකරණය විය යුතු ය. තමාගේ දැනුම හා විශේෂඥතා නිතිපතා වර්ධනය කර ගැනීම ඔවුන්ගේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අත්‍යවශ්‍ය ය.
මේ අතින් බලන විට සරසවි ගුරුවරුන්ට අවශ්‍ය වෘත්තීය සංවර්ධනයට ඉඩ කඩ පාදා දීම ද අවශ්‍ය වනු ඇත . එබඳු ඉඩකඩ නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීමට ඔවුන් ද අදිටන් කර ගත යුතු ය.

ඒ වාගේ උද්‍යෝගයකින් තම දැනුම නංවාගෙන තමාගේ රාජකාරියට කැප වුණු පිරිසක් සරසවි ඇදුරු මඩුල්ලට ඇතුලත් වීමද අත්‍යවශ්‍ය ය. ඒ කියන උනන්දුව හා කැප වීම පැතිය හැක්කේ තෘප්තිමත් සේවක පිරිසකගෙන් පමණි. -සේවය" යන පදය සරසවි ඇදුරන්ට යෙදීම අනුචිත විය හැකි ය. එහෙත් ඔවුන් වැටුප් අරගල පටන් ගත්තේ හාම්පුතාගෙන් වැඩි වරප්‍රසාද පතන සේවකයන් විදියට බව ද අමතක කළ නොහැකි ය.

වත්මන් සරසවි පිළිබඳ මූලික අවශ්‍යතා දෙකක් ලෙසට පෙනී යන්නේ අධ්‍යාපන තත්වය සහ ශිෂ්‍යයන් වෙතින් පළ විය යුතු ශික්ෂණය - විනය යන දෙපැත්ත ය. උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් දියත් කරන ලද නායකත්ව පුහුණු වැඩ සටහන ඒ අවශ්‍යතා දෙකින් එකක් සපුරා ලීමට බොහෝ දුරට සමත් වන බව පෙනෙයි. මින් මත්තට කලින් කළා සේ නවක සිසුවන් අල්ලා ගෙන ඔවුන් තමන්ට රිසි පරිදි හීලෑ කර ගන්නට හෝ විකට නලුවන් බවට පත් කර ගන්නට ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් සමත් නොවනු ඇත . නායකත්ව පුහුණුව ලැබූ තරුණ තරුණියන් සරසවි බිමට පිය නගන්නේ ආත්ම විශ්වාසයකින් හෙබි විනය ගරුක පිරිසක් හැටියට බව නම් සිතිය හැකි ය.

ඒ එක් අංශයක් පමණි. ඔවුන් සරසවිය තුළ ලද යුතු ශාස්ත්‍රීය වර්ධනය පිළිබඳ වගකීම සපුරා ලිය යුත්තේ ඔවුන්ට උගන්වන - මග පෙන්වන ඇදුරෝ ය. ඒ පිරිස් තුළ ද ආත්ම විශ්වාසයක් හා අභිමානයක් ද ජනිත විය යුතු ය. මේ කරුණ අවධාරණය කළ යුත්තේ වර්තමාන වාතාවරණය තුළ ඔවුන්ට ඒ විදියේ තමන්ගේ හැකියාව සහ කාර්යභාරය පිළිබඳ අභිමානයක් පවතින්නේද යන්න සැක සහිත නිසා ය.

දිනපතා පළවන පුවත්පත් වල දැන් දැන් සරසවි වැටුප් ගැටලුව විසඳෙනවා යන ආරංචිය කොතෙකුත් පළ වී ඇත . ඒ සැබෑවක් බවට පත්වනු ඇතැයි පැතීම පමණකි බාහිර පුද්ගලයනට කළ හැක්කේ. විසඳුණත් නැතත් එබඳු ප්‍රශ්නයක් මේ තරම් දුර දිග යාමට ඉඩ දීම නම් සමස්ත සරසවි ප්‍රජාවටම අහිතකර තත්වයකි. මාස ගණනක් තිස්සේ හරි හැටි ක්‍රියාකාරීත්වයක් දේශනාගාර තුළ සිදුව බවක් සිතිය නොහැකි ය. මෙබඳු මන්දගාමී වැඩ පිළිවෙලක් නිසා හානියක් සිදුවන්නේ සිසු පරපුරට පමණක් නොවේ. ඒ වූ කලී සමස්ත ජනතාව කෙරෙහිම බලපාන හානියකි. ජාතියේ ධන සම්පත් හා මිනිස් සම්පතක් අපතේ යැවීමකි. නිසි පල නොගෙන ඇට්ටකුණා වීමට ඉඩ දීමකි.

ඒ විදියේ අක්‍රිය තත්වයකින් සිදුවන පාඩුව හා පසුබෑම බලපානු ඇත්තේ ආසියාවේ ආශ්චර්ය නිර්මාණය කිරීමේ මහා ව්‍යයායාමයටය.

සරසවි වැටුප් ප්‍රශ්නය විසඳීමට නොහැකිව පැවතියේ මූල්‍ය ප්‍රතිපාදන නොමැති වීම නිසා බව කියනු ලැබීය. දැනටමත් සරසවි ඇදුරන්ට වැටුප් වර්ධක දී ඇති බවද කියැවිණ.

මැති ඇමතිවරුන්ට පඩිනඩි දීමනා දීමේදී කිසිදු අදිමදි කිරීමක් නැති රටක විද්වතුන් බිහි කරන ආයතනවල ජීව ශක්තිය ලෙසින් ගත යුතු සුපිරි විද්වතුන් සඳහා අවශ්‍ය හා උචිත වැටුප් ගැන තීරණයක් ගැනීමට පසුබට වීම තුළ ඇත්තේ නොහැකියාවට වඩා නොතේරුම නොහොත් ඕනෑනැතිකම යයි කීමට ද පෙළඹෙන්නන් සිටිය හැකි ය. එසේ කියන්නන්ට දොස් පවරන්නටත් බැරි ය.

වෘත්තීය ක්‍රියා මාර්ගයකට පිවිසෙන සේවක පිරිස් අතුරින් සාකච්ඡා මාර්ගයෙන් ප්‍රශ්න නිරාකරණයට සහ දුර්මත නොහොත් වැරදි අවබෝධ ඉවත්කර ගැනීමටත් පහසුම පිරිසක් ලෙසින් ජාතියේ බුද්ධිමත් උගතුන් ගත හැකි ය. ඔවුන් සමග කතාබහ හා සාකච්ඡා කිරීමට තරවටු හෝ අභියෝග අවශ්‍ය නොවිය යුතු ය. සාමකාමී ව සුහදව කතාබහ කොට මතභේද දුරුකර ගෙන එකඟතාවකට එළඹීම පහසු විය යුතු ය.

එබඳු පිරිසක් සමග කරගෙන ගිය හැංගි මුත්තම හමාර කළ යුතුය. දෙපක්ෂයක් අතර නම්බුකාර විදියට - - මහත්වරුන් හැටියට - කරන අදහස් හුවමාරුවක් හා සාකච්ඡාවක් සඳහා අවශ්‍යයෙන්ම තිබිය යුතු ගුණාංගයක් නැති තැන ඒවාගේ මහත්වරුන් විදියට අදහස් හුවමාරුවක් සිදු නොවේ. ඒ වූ කලි අන්‍යොන්‍ය ගෞරවයයි. සරසවි ඇදුරෝ තමන් සමග කතා කරන - තමන්ගේ ඉල්ලීම් සළකා බලන - පුද්ගලයන් නොහොත් දේශපාලකයන්ට ගරු කළ යුත්තෝ ය. ගරු කරන්නට නම් ගෞරවයට පාත්‍ර විය යුතු තත්වයක ඒ උදවිය ද සිටිය යුතු ය. ඒ ගෞරවය රැකගෙන හැසිරිය යුතු ය. කතා කළ යුතු ය. සරසවි ඇදුරන් කෙරෙහි ද නිසි ගරු සරුවක් පෑමට ඔවුන් සමත් විය යුතු ය. නිරහංකාර විය යුතු ය.

මේ කියන අන්‍යොන්‍ය ගෞරවය නොපැවතීම ප්‍රශ්නය දිග්ගැස්සීමට හේතුවක් වීද යන්නත් ප්‍රශ්නයකි.

